''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 3051-4924
https://journals.sjp.ac.lk/index.php/pumithiri
වෙළුම: 2; I කලාපය; 2025 මාර්තු; පිටු: 23-32

# අතීත ශ්‍රී ලංකාවේ දේශපාලන කටයුතු කෙරෙහි කාන්තා සහභාගීත්වය: සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඇසුරින්

**එස්. ඩබ්. සුපුන් ගයාන් විජේරත්න[1] සහ පී. ඩබ්. පියුමි හංසිකා සමරනායක[2]**
[1] ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය;
[2] මානවශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
gayand02i83@gmail.com

**සංක්ෂේපය**
ලොව විවිධ රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ද සමාන අවස්ථා සහිත සමාජයක් ගොඩනැඟීම අරමුණු කරගත් සංවිධාන රාශියක් බිහි වී ඇති අතර විවිධ වැඩසටහන් ගණනාවක් ද ක්‍රියාත්මක වෙමින් පවතී. පුරාතන ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමුකරන විට සමාජය තුළ කාන්තාවන්ට වැදගත් තත්ත්වයක් ලබාදීමට ක්‍රියාකළ ආකාරය පිළිබඳ විමසීම ඉතා වැදගත්ය. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන කටයුතුවලදී පුරුෂයාට මෙන් වැදගත් තත්ත්වයක් කාන්තාවට හිමි වූයේ ද? යන්නයි. පුරාතන ශ්‍රී ලාංකේය සමාජය තුළ කාන්තාවට හිමිව පැවති තත්ත්වය කෙටියෙන් විමසා බැලීමත්, දේශපාලන කටයුතු කෙරෙහි කාන්තා සහභාගීත්වය විමසා බැලීමත්, දේශපාලන කටයුතුවලදී පුරුෂයන්ට මෙන් වැදගත් තත්ත්වයක් කාන්තාවට හිමි වූයේ ද යන්න විමසීමත් මෙම පර්යේෂණයේ අරමුණු වේ. මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පුස්තකාල භාවිතයට ගනිමින් ප්‍රාථමික හා ද්විතියීක මූලාශ්‍රය පරිශීලනයෙන් දත්ත රැස් කොට, විශ්ලේෂණය කොට නිගමනවලට එළැඹීමේ ප්‍රවේශය භාවිතා කරන ලදී. පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන කටයුතු හා සම්බන්ධ අවස්ථා ගණනාවකදී කාන්තා සහභාගීත්වය හඳුනාගත හැකිය. රාජ්‍යත්වය සහ රාජ්‍යය වර්ධනයේ ආරම්භක කාලපරිච්ඡේදයේ සිටම කාන්තාවන් විවිධ බලතල දරන ලද අතර විවිධාකාරයෙන් දේශපාලන කාර්යයන්ට සම්බන්ධ වී තිබේ. රාජ්‍යත්වය සහ රාජ්‍යය විකාශනය වීමෙන් අනතුරුව විවිධ අංශයන්හිදී ඇය අත්‍යවශ්‍ය තැනැත්තියක වී තිබේ. දේශපාලන ක්ෂේත්‍රය තුළ වැදගත්ම අවස්ථාව වන රාජ්‍යත්වයට පවා කාන්තාවන් පත් වූ අවස්ථා දැකිය හැකිය. තවද රජුණ්ට උපදෙස් දීම, රජුණ් මෙහෙයවීම මගින් රජුණ්ටත් ඉහළින් සිටීම, ඇතැම් විට පුරුෂයන් අභිබවා තමාට අවශ්‍ය ලෙස කාන්තාවන් ක්‍රියාත්මක වීම වැනි අවස්ථාවන් රාශියක් හඳුනාගත හැකි වේ. එමෙන්ම දේශපාලනයේ වැදගත් තනතුරු කාන්තාවන් ද දැරීම, විවිධ විරුදයන් භාවිතා කිරීම හඳුනාගත හැකිය. දේශපාලන කටයුතු හා සම්බන්ධ වූ කාන්තාවන් පිළිබඳ විමසන විට ඔවුන් සමාජයේ ඉහළ තත්ත්වයක් දැරූවන් වූ බවත් ඔවුන්ට දේශපාලනය හා සමීප සබඳතාවයක් පැවති බවත් පැහැදිලි වේ. අතීතයේ සිට දේශපාලන කටයුතු කෙරෙහි පුරුෂාධිපත්‍යයක් දෘශ්‍යමාන වුව ද කාන්තාවන් ද පුරුෂයන්ට දෙවෙනි නොවන ආකාරයෙන් අනෙක් අංශයන්හිදී මෙන් දේශපාලන කටයුතුවලදී ද ක්‍රියාශීලී තැනැත්තියක වූ බවද දේශපාලන කටයුතු කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කිරීමට සමත් වූ බවද පැහැදිලිව ගම්‍යමාන වේ.

**මුඛ්‍ය පද:** කාන්තා සහභාගීත්වය, දේශපාලන කටයුතු, පුරාතන ශ්‍රී ලංකාව, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය

## හැඳින්වීම

ලොව විවිධ රටවල පුරාතන සමාජයන්වල කාන්තාවන්ට වැදගත් තත්ත්වයක් හිමි නොවූ බවට අදහස් ඉදිරිපත් වී තිබුණ ද ආසියානු සමාජයන් විමසන විට විශේෂයෙන් ඉන්දියාව, ශ්‍රී ලංකාව වැනි රටවල අතීත සමාජයන් තුළ කාන්තාවන්ට වැදගත් තත්ත්වයක් හිමි වූ බවට සාධක ගණනාවක් හමු වේ. සාහිත්‍යමය මෙන්ම පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ විමසන විට දේශපාලන, සමාජ, ආර්ථික, ආගමික හා සංස්කෘතික යන සෑම ක්ෂේත්‍රයකදීම පාහේ වැදගත් තත්ත්වයක් කාන්තාවන්ට හිමි වී ඇති බව හඳුනාගත හැකි අතර මේ පිළිබඳ පර්යේෂණ ගණනාවකින් අවධාරණය කර තිබේ. අතීත ශ්‍රී ලාංකේය සමාජය තුළ දේශපාලන කටයුතුවලදී කාන්තාවන්ට හිමි වූ තත්ත්වය පිළිබඳ විද්වත් අවධානය විටින් විට යොමු වී තිබුණ ද ඒ පිළිබඳ සියුම් හා ගැඹුරු විමර්ශනයන් සිදු වී ඇත්තේ අල්ප වශයෙනි. එකී පර්යේෂණයන් ද ආශ්‍රය කර ගනිමින් එම පර්යේෂණයන්හි දී

අවධානය යොමු නොවූ අංශයන් කෙරෙහි ද අවධානය යොමු කරමින් පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන කටයුතුවලදී කාන්තා සහභාගීත්වය කෙබඳු වූයේ ද යන්න විමසා බැලීම ද ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලද්දේ කුමන කාරණාවන් ද යන්න පිළිබඳ විමසීම ද මෙහිදී සිදු කරනු ලබයි.

**සාහිත්‍ය විමර්ශනය**

පුරාතන ශ්‍රී ලංකාවේ කාන්තාව පිළිබඳ අධ්‍යයනයන් කීපයක් ම සිදු වී ඇති බව හඳුනාගත හැකිය. මහාචාර්ය හේම එල්ලාවල මහතා විසින් 1962 වසරේදී ප්‍රකාශයට පත්කළ පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය කෘතිය විමසන විට පස්වන පරිච්ඡේදයේදී කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ සාකච්ඡා කර තිබේ. මෙහිදී විවාහයන්, දික්කසාදයන්, බහුභාර්යා සේවනය, කාන්තා අධ්‍යාපනය ආදිය පිළිබඳ අවධානය යොමුකර ඇති නමුත් දේශපාලන කටයුතු හා කාන්තාව අතර සබඳතාවය පිළිබඳ ඍජුව අවධානය යොමුකර නොමැති නමුත් මෙහිදී සාකච්ඡා වන ඇතැම් තොරතුරුවලදී කාන්තාව දේශපාලන කටයුතු හා සම්බන්ධ වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් වේ. මහාචාර්ය ඇම්. බී. ආරියපාල මහතා විසින් 1962 වසරේදී ප්‍රකාශයට පත්කළ මධ්‍යකාලීන ලංකා සමාජය නැමැති කෘතිය මගින් මධ්‍යකාලීන අවධියේ ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය පිළිබඳ ගැඹුරින් විමසීමට ලක්කර තිබෙන අතර එහිදී දොළොස්වන පරිච්ඡේදය මගින් ගෘහස්ථ ජීවිතය පිළිබඳ විමසීමට ලක්කර තිබෙන අතර විවාහය, බහු භාර්යා සේවනය ආදිය පිළිබඳ මෙන්ම කාන්තාවන් පිළිබඳව විවිධ දෘෂ්ටිකොණයන්ගෙන් සාකච්ඡා කර තිබේ. නමුත් දේශපාලන හා කාන්තාවන් අතර සබඳතාවය පිළිබඳ ඍජුව අවධානය යොමුකර නොමැති බව දක්නට ලැබේ.

අමරදාස ලියනගමගේ මහතා හා රණවීර ගුණවර්ධන මහතා විසින් සංස්කරණය කොට 1965 වසරේදී ප්‍රකාශයට පත් කළ අනුරාධපුර යුගය නැමැති කෘතියට අයි. කේ. ඉන්ද්‍රපාල මහතා විසින් "සමාජ තොරතුරු'' යනුවෙන් පරිච්ඡේදයක් එක් කර තිබෙන අතර එහිදී පුරාතන ශ්‍රී ලංකාවේ කාන්තාව පිළිබඳ තරමක අවධානයක් යොමු වී ඇති බව පෙනේ. දේශපාලනික වශයෙන් පවා ඇය යම් කිසි වැදගත් තත්ත්වයක් ලබා සිටි බව සඳහන් කළ ද ඒ පිළිබඳ වැඩි වශයෙන් විමසීමක් සිදුකර නොමැත. එමෙන්ම මහාචාර්ය ඉන්ද්‍රකීර්ති සිරිවීර මහතා විසින් 1971 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද මධ්‍යතන ලංකාව කෘතියේ දී මෙන්ම 2001 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද රජරට ශිෂ්ටාචාරය හා නිරිතදිග රාජධානි කෘතියේ දී ද පුරාතන ශ්‍රී ලංකාවේ කාන්තාව පිළිබඳ අවධානය යොමුකර ඇත. රජරට සභ්‍යත්ව අවධියේ සමාජ තත්ත්වය පිළිබඳ විමසීමේදී මෙලෙස කාන්තාව පිළිබඳ සංක්ෂේප වශයෙන් විමසා තිබෙන අතර ආගමික ක්ෂේත්‍රය තුළ කාන්තාවගේ තත්ත්වය, දේපළ හිමිකම, ආර්ථික කටයුතුවලදී කාන්තා දායකත්වය, අධ්‍යාපනික වශයෙන් ලබා සිටි ප්‍රගතිය ආදිය පිළිබඳ සාකච්ඡා කර ඇති නමුත් දේශපාලන කටයුතු කෙරෙහි කාන්තා සහභාගීත්වය පිළිබඳව අවධානය යොමුකර නොමැති බව දක්නට ලැබේ.

මහාචාර්ය ඉන්ද්‍රාණි මුණසිංහ මහත්මිය විසින් 1998 වසරේදී ප්‍රකාශයට පත්කර තිබෙන පැරණි ලක්දිව කාන්තාව (ක්‍රි. පූ. සවන සියවසේ සිට ක්‍රි. ව. පහළොස්වන සියවස දක්වා) කෘතිය මගින් පුරාතන ලංකාවේ කාන්තාව පිළිබඳ සියුම් විමර්ශනයක් සිදුකර තිබෙන අතර එහිදී ආගමික හා ආර්ථික අංශයන්, කාන්තාව පිළිබඳ ආකල්ප කෙරෙහි වැඩි අවධානයක් යොමුකර ඇති අතර සිව්වන පරිච්ඡේදයේදී දේශපාලන කාන්තාව පිළිබඳ අවධානය යොමුකර තිබේ. මෙහිදී දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවගේ හැසිරීම පිළිබඳ තරමක් සංක්ෂිප්ත වුවත් ඉතා වැදගත් සාකච්ඡාවක් සිදුකර තිබේ. මහාචාර්ය ඇස්. බී. හෙට්ටිආරච්චි මහතා විසින් 2008 වසරේදී ප්‍රකාශයට පත්කළ ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය ක්‍රි. ව. 300 පමණ සිට ක්‍රි. ව. 1000 පමණ දක්වා නැමැති කෘතිය මගින් පුරාතන ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය පිළිබඳ විමසීමට ලක්කර තිබෙන අතර මෙම කෘතියේ සිව්වන පරිච්ඡේදයේදී කාන්තාවගේ තත්ත්වය පිළිබඳ සාකච්ඡා කොට තිබේ. එහිදී කාන්තාව පිළිබඳ සමාජ ආකල්ප, ගිහි හා පැවිදි සමාජයන් තුළ ශාසනික සේවාව, දේපළ උරුමය, ප්‍රවේණි උරුමය, රැකියා සහ වෘත්තීන් ආදිය පිළිබඳ සාකච්ඡා කර තිබෙන අතර දේශපාලනය හා කාන්තාව පිළිබඳව ද අවධානය යොමුකර තිබේ. මෙහිදී කාන්තාව දේශපාලනයට සම්බන්ධ වීමෙන් උද්ගත වූ අර්බුධ සහගත තත්ත්වයන් හා අයහපත් බලපෑම් පිළිබඳ පමණක් සාකච්ඡා කර ඇති අතර කාන්තාවගේ දේශපාලන කාර්ය සංසිද්ධිය ඉතා පහළ මට්ටමක පවතින්නක් බව පෙන්වා දෙයි. මේ ආකාරයෙන් පූර්ව පර්යේෂණයන් විමසන විට පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන කටයුතු කෙරෙහි කාන්තාවගේ සහභාගීත්වය පිළිබඳ අවධානය යොමුව ඇත්තේ අල්ප වශයෙන් බවත් අවධානය යොමු වී ඇති අවස්ථාවලදී පවා සංක්ෂිප්ත හෝ එක්

දෘෂ්ටිකෝණයකින් පමණක් විමසා තිබෙන බවත් හඳුනාගත හැකිය.

ක්‍රමවේදය

මෙම පර්යේෂණයේදී ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය භාවිතා කරන ලදී. එහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුගතව යමින් පළමුව පුස්තකාල පර්යේෂණ ඔස්සේ ප්‍රාථමික මූලාශ්‍ර පරිශීලනය කරමින් දත්ත රැස් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීමත් ද්විතියික මූලාශ්‍ර පරිශීලනය කරමින් දත්ත රැස් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීමත් අනතුරුව ක්‍රමානුකූලව පෙළගැස්වීම සිදු කළ අතර පසුව නිගමනවලට එළඹීම සිදු කරන ලදී.

**සාකච්ඡාව**

**අතීත ශ්‍රී ලාංකේය කාන්තාව**

පුරාතන ලක්දිව කාන්තාව විවිධ අංශයන්හි වැදගත් තත්ත්වයක් දරනු ලැබූ බවට සාධක ගණනාවක් හමු වේ. මෙහිදී සමාජය තුළ උසස් තත්ත්වයක් සහිත ප්‍රභූ කාන්තාවන් වාසය කළ බව පෙනේ. විශේෂයෙන්ම ප්‍රභූවරුන්ගේ බිරින්දෑවරුන් මෙන්ම දියණියන් මෙලෙස වැදගත් තත්ත්වයක් උසුලා තිබෙන බවට වංසකතා ප්‍රමුඛ සාහිත්‍ය මූලාශ්‍ර මෙන්ම ශිලා ලේඛන ප්‍රමුඛ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර විමසීමේදී පැහැදිලි වේ. එමෙන්ම සමාජය තුළ කාන්තාවන් පිළිබඳ යහපත් ආකල්ප පැවති බව හඳුනාගත හැකි අතර ගෘහස්ථ ජීවිතය තුළ පවා ඇයට වැදගත් තත්ත්වයක් හිමිවිය. ආර්ථික කටයුතු හා සම්බන්ධ අවස්ථා ගණනාවක දී ම කාන්තා සහභාගීත්වය පැහැදිලිව හඳුනාගත හැකිය. වී වගාවේදී කුඹුරට ආහාර සැපයීම, කුඹුරු රැකීම, ගොයම් කැපීම, වී වේළීම සහ කෙටීම වැනි කටයුතු කෙරෙහි සම්බන්ධ වූ අතර එළවලු හා පළතුරු වගාවට සම්බන්ධ වීම, වෙළෙඳ කටයුතුවලට සම්බන්ධ වීම, සත්ත්ව පාලනය සිදු කිරීම, උක්හකුරු කර්මාන්තය, කුඹල් කර්මාන්තය, කපු කර්මාන්තය, රෙදි ඇපිල්ලීම, සූප ශාස්ත්‍රය වැනි කටයුතුවල නිරත වීම මෙන්ම මල්මාලා ගෙතීම, උපස්ථායිකාවන් ලෙස කටයුතු කිරීම, ගුරු වෘත්තිය, රාජ්‍ය සේවය, කිරි මව්වරු, පරිවාර සේවිකාවන්, දාස මෙහෙය වැනි වෙනත් වෘත්තීන් ද සිදු කළ බවට තොරතුරු හමු වේ. ආගමික අංශය විමසන විට බෞද්ධ භික්ෂුණීන්, උපාසිකාවන් වාසය කර ඇති බව හඳුනාගත හැකි අතර වෙහෙර විහාරයන් වෙනුවෙන් පරිත්‍යාග කළ කාන්තාවන් පිළිබඳව ද ඊට අතිරේකව පත්තිනි, ලක්ෂ්මී, සරස්වතී වැනි දේවතාවියන් ඇදහීම ද පැවති බව පෙනේ. සංස්කෘතිකමය වශයෙන් විමසන විට සිතුවම්, මූර්ති, කැටයම් ආදියෙහි කාන්තා නිරූපණයන් විශාල ප්‍රමාණයක් පවතින බවට නිදසුන් හමුවන අතර ඒවායෙහිදී කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම්, ආභරණ, රූපලාවන්‍ය කටයුතු වැනි බොහෝ තොරතුරු ප්‍රමාණයක් හෙළිදරව් වේ. මේ අනුව පැරණි අවධියේ මෙරට කාන්තාවට සෑම අංශයකින්ම පාහේ වැදගත් තත්ත්වයක් පැවති බව පැහැදිලි වේ.

**දේශපාලන කටයුතුවලදී කාන්තා සහභාගීත්වය**

පුරාතන අවධියේ කාන්තාව දේශපාලන කටයුතු කෙරෙහි ඍජු හා වක්‍රාකාරයෙන් සම්බන්ධ වූ ආකාරය විදහා දැක්වෙන නිදසුන් රාශියක් සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඇසුරින් අනාවරණය කරගත හැකි වේ. දේශපාලන කටයුතු හා සම්බන්ධ ආදීතම අවස්ථාවල සිට පසුකාලීන අවධීන් දක්වා විවිධ අවස්ථාවන්හිදී විවිධ ස්වරූපයෙන් කාන්තා සහභාගීත්වය හඳුනාගත හැකිය. මෙරට රාජ්‍යත්වය හා රාජ්‍ය වර්ධනය වීම ආරම්භ වන මුල් කාලීන අවධියේ සිටම පුරුෂයන් මෙන් කාන්තාවන් ද ප්‍රාදේශීය පාලනයට සම්බන්ධ වීම හා විවිධ බලතල දැරීම පිළිබඳ තොරතුරු සමුදායක් පූර්ව බ්‍රාහ්මී ලිපිවලින් හමු වේ. රාජ්‍යත්වය විකාශනය වීමේදී ග්‍රාමීය නායකයන් වූ ගමිකයන් හට නායකත්වය දුන් පරුමකවරුන් පිළිබඳ තොරතුරු හමුවන අතර ඔවුන් සමකාලීන විවිධ සාධකවල බලපෑම මත ක්‍රමයෙන් බලය වර්ධනය කරගත් පිරිසක් ලෙස හඳුනාගත හැකිය. මෙම පරුමකවරුන් පිළිබඳ අදහස් දක්වන සෙනරත් පරණවිතාන මහතා පවසන්නේ පරුමකවරු වනාහි මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ ආදිතම පාලක කොට්ඨාසය බවයි. පාලි භාෂාවේ ''පාමොක්ඛ'' යන වචනය යෙදී ඇති අයුරු පරීක්ෂා කරන පරණවිතාන මහතා පාමොක් යන වචනයෙන් පරුමක යන්න බිඳී ආ නමුත් ව්‍යවහාරයට පත්වන්නට ඇතැයි විශ්වාස කරයි. පාලි භාෂාවේ ''ගණ පාමොක්ඛ'' යන්න නිදසුන් ලෙස ගනිමින් ශ්‍රී ලංකාවේ ''පරුමකවරුන්'' වූ කලී පැරණි ගණ තන්ත්‍ර මෙන් ම ගෝත්‍රිකයන් අතර විසූ පාමොක්ඛ තත්වයේ පිරිසක් බව හඳුන්වාදීමට උත්සාහ කරයි. (Paranavitana, 1936)

මෙහිදී පූර්ව බ්‍රාහ්මී ලිපිවල සඳහන් "පරුමකලු", " පරුමකලි", "පරුමකල" පදයන් වැදගත් අවස්ථාවකි. මෙයින් හඳුන්වා ඇත්තේ පරුමක තත්ත්වය දරනු ලැබූ කාන්තාවන් බවට විශ්වාස කරනු ලබයි. (මුණසිංහ, 1998) මෙම පදයන් අන්තර්ගත ලිපි කීපයක් හමුවේ.

- බ්‍රාහ්මණයාගම ලිපිය - "පරුමක-දත-ඣිත පරුමක-බගිනිය-නදිකශ ඣය පරුමකලු-ශමණය ලෙණෙ අගත-අනගත චතු-දිශ ශගශ

දිනෙ" (ප්‍රමුඛ දත්තගේ දියණිය, ප්‍රමුඛගේ සොයුරියගේ පුත් නන්දිකගේ භාර්යාව වන ප්‍රමුඛාවිය සමණගේ ලෙණ පැමිණියාවූත් නොපැමිණියාවූත් සතරදෙස සංඝයාට) (Inscription of Ceylon Vol.I, No.148)

- රිටිගල මරක්කල උල්පොත ලිපිය - " පරුමක-රෙතහ ඣය පරුමක-නගුලි-ඣිත පරුමකලු-දි[පනි]ය ලෙණෙ ශගශ දිනෙ" (ප්‍රමුඛ රෙතගේ භාර්යාව වන ප්‍රමුඛ නගුලිගේ දියණිය වන ප්‍රමුඛාවිය දීපානීගේ ලෙණ සංඝයාට දෙන ලදී.) (Inscription of Ceylon Vol.I, No.260)
- එරුපොතාන ලිපිය - "පරුමක-මිත-ඣය පරුමක-ශත-නශත-ඣිත පරුමකලු-පුශය ලෙණෙ අගත-අනගත-චතු-ශගශ" (ප්‍රමුඛ මිත්තගේ භාර්යාව වන ප්‍රමුඛ ශත නශතගේ දියණිය වන ප්‍රමුඛාවිය පුස්සාගේ ලෙණ පැමිණි නොපැමිණි සිව්දිග සංඝයාට) (Inscription of Ceylon Vol.I, No.331)
- සිතුල්පව්ව ලිපියක - "පරුමක-මහතිශ-පුත පරුමක-අයිමරහ ලෙණෙ ඣය ශදි ශදය පරුමක-සුපටම-ඣිත පරුමකලු-සොණය" (ප්‍රමුඛ මහාතිස්සගේ පුත් වන ප්‍රමුඛ අයිමරගේ ලෙණ භාර්යාව සමඟ සම දීමනාව, ප්‍රමුඛ සුපටමගේ දියණිය වන ප්‍රමුඛාවිය ශොණ සමඟ) (Inscription of Ceylon Vol.I, No.610)
- යාන්ගල ලිපිය - "පරුමක නසික උති පරුමකනේ (අ)නුර(ද)-ගම යසදාය..." (අනුරාධගාමයේ ප්‍රමුඛ නසික උති සහ ප්‍රමුඛාවිය යසදා..) (Inscription of Ceylon Vol.I, No.706)
- කොල්ලදෙණිය ලිපිය - "පරුමක-පුශදෙවශ ඣය පරුමක(ල)-ශොනය ලෙණෙ නාගයහ රඣියිහි කතෙ ශගශ" (ප්‍රමුඛ ඵුස්සදේවගේ භර්යාව වන ප්‍රමුඛාවිය සෝණාගේ ලෙණ සංඝයාට) (Inscription of Ceylon Vol.I, No.736)
- කුරගල ලිපිය - "(පරුමක) ශුමනහ පරුමකලු ශුමය" (ප්‍රමුඛ සුමනගේ, ප්‍රමුඛාවිය සුමාගේ) (Inscription of Ceylon Vol.I, No.775)
- මැදගම විහාර ලිපිය - "නඩ-තිශහ බරිය පරුමකලි හුම(න)ය ලෙණෙ" (තිස්ස නම් නළුවාගේ භර්යාව වන ප්‍රමුඛාවිය හුමනාගේ ලෙන) (Inscription of Ceylon Vol.I, No.910)
- විරඳගොඩ ලිපිය - "පරුමකල-ශුමනය ච පරුමක-ශමුදහ චිත-තෙරහ ච ලෙණෙ ශගශ" (ප්‍රමුඛාවිය සුමනාගේ සහ ප්‍රමුඛ සමුද්දගේ ද චිත්ත තෙරුණ්ගේ ද ලෙණ සංඝයාට) (Inscription of Ceylon Vol.I, No.1096)

මේ අනුව මෙරට දේශපාලන කටයුතු හා සම්බන්ධ ආදීතම අවස්ථාවලදී ඒ සඳහා කාන්තා සහභාගීත්වය සිදු වී ඇති බව පැහැදිලිය. පරුමකවරුන්ගේ කාර්යභාරය කෙබඳු ක්ෂේත්‍ර කෙරෙහි පැතිරී තිබුණේ ද යන්න පැහැදිලි නොවුන ද ඔවුන්ට දේශපාලනික වශයෙන් වැදගත් තත්ත්වයක් හා බලතල ප්‍රමාණයක් හිමි ව පැවති බව පැහැදිලි වන නිසා පරුමක තත්ත්වය දරනු ලැබූ කාන්තාවන්ට ද එම තත්ත්වය හා බලතල හිමිව පවතින්නට ඇතැයි නිගමනය කළ හැකිය. ඉන්ද්‍රාණි මුණසිංහ මහත්මිය පෙන්වාදෙන්නේ මෙලෙස පරුමක විරුදය දැරූ කාන්තාවන් විසින් ප්‍රාදේශීය පාලනය ගෙනගිය බව පිළිගැනීමට සී. ඩබ්ලිව් නිකලස් මහතා මැලි වුව ද කාන්තාව දේශපාලන කටයුතුවල නිරත වූ බව මෙවැනි ලිපි මගින් මැනවින් පැහැදිලි වන බවයි. (මුණසිංහ, 1998)

**රාජ්‍ය අභිෂේකය සඳහා කාන්තාව වැදගත් වීම**

මෙරට රාජ්‍යත්වය හා රාජ්‍ය වර්ධනය වීමෙන් අනතුරුව ඒ වටා විවිධ සිරිත් විරිත් හා සම්ප්‍රදායයන් රාශියක් ගොඩනැගුණු අතර විවිධ අංශයන්හි දේශපාලන කටයුතු සඳහා කාන්තාව අත්‍යවශ්‍ය කෙනෙකු වූ බව ද හඳුනාගත හැකි වේ. රාජ්‍යත්වය සම්බන්ධ වංසකතාගත විස්තර විමසන විට රජෙකුගේ අභිෂේකයට අග බිසවක් සිටිය යුතු වූ බව පෙනේ. බොහෝ විට අගබිසව ක්ෂත්‍රීය කාන්තාවක් විය යුතු බවට අදහස් පැවති බව දක්නට ලැබේ. මහාවංසයේ දැකවෙන ආකාරයට තිස්ස රජු විසින් අශෝක රජු වෙත යැවූ දූත පිරිස අත අශෝක රජු විසින් රාජාභිෂේකයට අවශ්‍ය පංච කකුධ භාණ්ඩ එවන ලද අතර එහිදී රාජාභිෂේකයට අවශ්‍ය අනෙකුත් දෙවල් පිළිබඳ කරන සඳහනේ දී " කුමාරිකං" වශයෙන් දැක්වෙයි. (ඌණපූරණසහිතො මහාවංසො, 11 පරි. 30 ගාථාව) මෙම "කුමාරිකං" යන පදය අර්ථ දක්වන වංසත්ථප්පකාසිනිය සඳහන් කරන්නේ "කුමාරිකං" යනු ක්ෂත්‍රීය කන්‍යාවකි වශයෙනි. (වංසත්ථප්පකාසිනී, 230 පි)

තවද රාජාභිෂේකය සිදු කරන ආකාරය පිළිබඳ තොරතුරු දක්වන වංසත්ථප්පකාසිනිය සඳහන් කරන්නේ,

එහෙයින් ම මැඳුම් සඟියෙහි චූලසීහනාද සුත්ත වර්ණනායෙහි දී හෙළ, අටුවායෙහි මෙසේ කියන ලදි ; කෙසේ ය යත්, පළමුවෙන් ම අභිෂේක ලබන රජ දරුවන් විසින් ස්වර්ණමයාදී ත්‍රිවිධ ශංඛයන් ද, ගංගා නදී ජලය ද, ක්ෂත්‍රිය කන්‍යාවක් ද ලැබිය යුතු යයි පවසා රජදරුවන්ගේ අභිෂේක විධි ද කියන ලදි. අභිෂේක මංගලය පිණිස අලංකෘත කොට පිළියෙළ කරන ලද මණ්ඩපය තුළ ඉදි කරන ලද උදුම්බර ශාඛා මණ්ඩපය මැද මනා කොට පිහිටුවන ලද උදුම්බර භද්‍ර පීඨයෙහි අභිෂේකපේක්ෂක අභිජාත ක්ෂත්‍රියයා හිඳුවා, පළමු කොට මංගලාභරණයෙන් සැරසී ගත් ජාති සම්පන්න ක්ෂත්‍රිය කන්‍යාවක් තොමෝ ගංගානදී ජලය පිරි සමුද්‍රජ දක්ෂිණාවෘත ශංඛයක් දෙඅතින් මනා සේ ගෙන ඔහුගේ හිසට උඩින් ඔසවා හිස් මුදුනෙහි අභිෂේක ජලය ඉසිමින් මෙසේ කියයි. " දේවයිනි, සියලු ක්ෂත්‍රිය ගණයා තමන් ආරක්ෂා කරනු වස් ඔබ මේ අභිෂේකයෙන් අභිෂේක කොට මහරජු ලෙස පත් කොට ගන්නාහ ; රාජ ධර්මයෙහි පිහිටා දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරනු මැන ; මේ ක්ෂත්‍රිය ගණයා වෙත පුත්‍ර ස්නේහය අනුව ගිය අනුකම්පා සහගත සිත් ඇතිව, හිත කැමැතිව, මෙත් සිත් ඇතිව පවතිනු මැන ; ඔවුන් රැකවරණ යොදා ආරක්ෂා කරනු මැන." (වංසත්ථප්පකාසිනී, 230 පි)

මේ අනුව දේශපාලන ක්ෂේත්‍රයේ ඉහළම තනතුර වන රාජ්‍යත්වය සඳහා කාන්තාව අත්‍යවශ්‍ය කෙනෙකු වූ බව පැහැදිලිය. එමෙන්ම අනුරාධපුර රාජධානි සමයේ සිට මහනුවර රාජධානියේ අවසාන සමය තෙක් පාලන කටයුතුවල නිරත වූ සෑම රජකෙනෙකුටම පාහේ අගබිසවක් සිටි අතර ඇය මියගිය විට වෙනත් බිසවන් අතරින් කෙනෙකු අග බිසව බවට පත් කරගත් බව ද දක්නට ලැබේ.

**දේශපාලන විවාහ සහ කාන්තාව**

රාජ්‍ය බලය තහවුරු කර ගැනීම සඳහා උරුමය පැවති කාන්තාවන් ඉතාමත් වැදගත් වූ බවට ද සාධක හමු වේ. මහනුවර රාජධානි සමයේ කරලියැද්දේ බණ්ඩාර රජුගේ අමාත්‍යවරයෙකුව සිට පසුව සීතාවක 1 වන රාජසිංහ රජුට මහනුවර රාජධානිය අල්ලා ගැනීමට උපකාර කළ වීරසුන්දර බණ්ඩාරගේ පුත් කෙනෙප්පු බණ්ඩාර කුමරු රාජ්‍ය උරුමයක් නොතිබූ අයෙකු වන අතර ඔහු විසින් කරලියැද්දේ බණ්ඩාර රජුගේ දියණිය වූ කුසුමාසන දේවිය විවාහ කරගෙන ඔහුට නොතිබූ රාජ්‍ය උරුමය ලබා ගැනීමට කටයුතු කරන ආකාරය හඳුනාගත හැකි වේ. (මහාවංසය, 94 පරි. 9 ගාථාව) අනතුරුව ඔහු 1 වන විමලධර්මසූරිය ලෙස මහනුවර රාජධානියේ බලයට පත් ව වසර 12 ක් පමණ පාලන කටයුතු සිදු කර තිබේ.

අතීත ශ්‍රී ලංකාවේ දේශපාලන කටයුතු විමසන විට බලය ව්‍යාප්ත කර ගැනීමේ හා ආරක්ෂා කර ගැනීමේ උපක්‍රමයක් වශයෙන් විවිධ සබඳතා ගොඩනගා ගැනීමට ක්‍රියාකළ බව දක්නට ලැබේ. මෙහිදී මිත්‍ර සබඳතා ඇති කරගත් අතර ප්‍රාදේශීය වශයෙන් මෙන්ම විදේශ රටවල පාලකයන් සමඟ සබඳතා ගොඩනගා ගැනීමේදී දේශපාලන විවාහයන් ඉතාමත් වැදගත් විය. මෙවැනි කටයුතුවලදී කාන්තාවන්ට හිමි වූයේ වැදගත් තත්ත්වයකි. මෙය අතීතයේ පෙරදිග මෙන්ම අපරදිග දේශපාලන චින්තනයන්හිදී බෙහෙවින් භාවිතයට ගත් අවස්ථාවකි. ප්‍රාදේශීය වශයෙන් විමසන විට කාවන්තිස්ස රජු විහාරමහා දේවිය විවාහ කර ගැනීම (මහාවංසය, 22 පරි. 23 ගාථාව) ආදිය හඳුනාගත හැකි අතර විදේශීය වශයෙන් ඇති කරගත් විවාහයන් විමසන විට අනුරාධපුර රාජධානි සමයේ 4 වන මිහිඳු රජු කාලිංග වංශික කුමරියක් විවාහ කර ගැනීම හා එම විවාහය නිසා සිංහල වංශය මනාකොට පිහිට වූ බවක් ද සඳහන් වේ. "ඒ නරශ්‍රේෂ්ඨ තෙමේ ලක්දිව ක්ෂත්‍රියයයන් ඇති කලත් කලිඟු සක්විති වංසයෙහි උපන් කුමරියක ගෙන්වා ඇය තමහට අගමෙහෙසුන් කෙළේය. ඒ රැජනට පුතුන් දෙදෙනෙක් හා මනෝරංජනය කරන එක් දුවක් ද වූහ. පුතුන් ඈපා කළහ. දියණියනුත් යුව රාජිනිය කෙළේය. හේ රජ තෙමේ මෙසේ සිංහල වංසය ද තැබීය." (මහාවංසය, 54 පරි. 10 ගාථාව) පොළොන්නරු රාජධානි සමයේ 1 වන විජයබාහු රජු කාලිංග වංශික තිලෝකසුන්දරී කුමරිය විවාහ කර ගත් අතර ඔහුගේ සහෝදරිය වූ මිත්තා කුමරිය පාණ්ඩ්‍ය වංශික මානාභරණ කුමරුට විවාහ කර දීමත් ඔහුගේ පුත්‍ර වික්‍රමබාහු කුමරුට කාලිංග වංශික සුන්දරී කුමරිය විවාහ කර දීමත් පිළිබඳ තොරතුරු හමු වේ. (මහාවංසය, 59 පරි. 30-33 ගාථා) තවද 1 වන පරාක්‍රමබාහු රජු කාම්බෝජ කුමරෙකුට විවාහ කර දීමට සිංහල කුමරියක් යැවීම පිළිබඳ සඳහනක් ද මහාවංසයේ දැක්වේ. "ඉක්බිති ලංකාධිපතිහු විසින් කාම්බෝජ රට බලා යවන ලද රජ කුමරියක් ද බලාත්කාරයෙන් උදුරා ගත." (මහාවංසය, 76 පරි. 35 ගාථාව) මහනුවර රාජධානි සමයේ 2 වන විමලධර්මසූරිය හා ඔහු පුත් ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුණ් දෙදෙනා මධුරාපුර කුමාරිකාවන් විවාහ කරගත් බව පෙනේ. (මහාවංසය, 97 පරි. 3, 25 ගාථා)

**දේශපාලන තීරණ සම්බන්ධයෙන් කාන්තාවගේ මැදිහත්වීම**

දේශපාලන කටයුතුවලදී කාන්තාවන්ගේ සහයෝගය ඉතාමත් වැදගත් වූ ආකාරය හඳුනාගත හැකිය. රාජ්‍ය කිරීමට මෙන්ම සටන් ව්‍යාපාර සඳහා අනුශාසනා කිරීම් පිළිබඳ දුටුගැමුණු රජුගේ කටයුතුවලට විහාරමහා දේවියගේ සහයෝගය හිමිවීමෙන් පැහැදිලි වේ. (මහාවංසය, 25 පරි. 7-8 ගාථා) ලම්භකර්ණ ගෝත්‍රිකයන් මරණයට පත් කිරීමට සූදානම් වූ ඉළනාග රජුට ඔවුන් ඝාතනය නොකොට නාසය සහ මහපට ඇඟිලි පමණක් සිඳවීමට උපදෙස් දෙන ලද්දේ ද රජුගේ මෑණියන් විසින් බව මහාවංසයෙන් පැහැදිලි වේ. (මහාවංසය, 35 පරි. 42-44 ගාථා) එමෙන්ම රාජ්‍ය උරුමය ලබා ගැනීමට උපකාර කිරීම් පිළිබඳ තොරතුරු ද හමු වේ. වසභ රජු රාජ්‍යත්වයට පත් වීමෙන් පසු ඔහුගේ නැන්දනිය වූ පොත්ථා විවාහ කර ගැනීම පිළිබඳ විස්තරයක් මහාවංසයේ දැකගත හැකිය. (මහාවංසය, 35 පරි. 70 ගාථාව) මෙහි සඳහන් "පුබ්බහුතොපකාරිකං" යන පදය විග්‍රහ කරන වංසත්ථප්පකාසිනිය දක්වන්නේ තමා හට පෙර උපකාරී වූ, උපකාර කළ පොත්ථා නම් නැඳි වසභ තෙමේ සිය අග මෙහෙසිය කරගත්තේය යනුවෙනි. (වංසත්ථප්පකාසිනී, 524 පි) මේ අනුව රාජ්‍ය ලබා ගැනීමට විවිධ අයුරින් උපකාර කළ කාන්තාවන් සිටි අතර එකී උපකාර ලැබූ රජුන් එම කතුන්ට කෘතගුණ දැක්වීමට ද පසුබට නොවූ බව පැහැදිලි වේ.

රාජ්‍යත්වය සම්බන්ධ අභියෝගකාරී අවස්ථාවලදී කාන්තාවන් උපකාර කිරීම පිළිබඳ තොරතුරු ද හමුවේ. වළගම්බා රජුට සෝමා දේවියගෙන් ලැබුණු සහාය පිළිබඳ මහාවංසයේ දැක්වෙන්නේ සත් ද්‍රවිඩ ආක්‍රමණය සිදු වන විට පළායන වළගම්බා රජු ගමන්ගත් රථයේ බර සැහැල්ලු වනු පිණිස සෝමා දේවිය රථයෙන් බසින ලද බවයි. (මහාවංසය, 33 පරි. 46 ගාථාව) වංසත්ථප්පකාසිනිය සඳහන් කරන්නේ සෝමා දෙවියගේ අනුදැනීමෙන්ම රියෙන් බැස්සීය යනුවෙනි. (වංසත්ථප්පකාසිනී, 493 පි) කෙසේ වුවද කාන්තාවන් තම දිවි පරදුවට තබා හෝ රජුන් වෙනුවෙන් සහාය වූ බව මෙයින් ගම්‍ය වෙයි. දේශපාලනයට ප්‍රබල ලෙස සම්බන්ධ වූ කාන්තාවන් පිළිබඳ සාධක ද හමු වේ. මහානාම රජුගේ දියණිය වූ සංඝා කුමරිය විසින් මහානාම රජුට පසු බලයට පත් දෙවන බිසවකගේ පුත්‍ර සොත්ථිසේන මරවා තම ස්වාමියාව රාජ්‍යත්වයට පත් කිරීමට කටයුතු කළ බව හඳුනාගත හැකිය. "මහානාම රජුට දා දෙමළියක කුසහොත් සොත්තිසේන නම් කුමාරයෙක් ද එසේම මෙහෙසි දියණි වූ සංඝ නම් කුමාරිකාවන් ද වූහ. එකල සොත්තිසේන කුමාර රජ පැමිණ සංඝා කුමාරිය විසින් මරණ ලදහ. එදවස්හි දිම ඕ තොමෝ බෙරපියවි කරවා තමා වල්ලභ ඡත්තගාහකයා හට රජය දින." (මහාවංසය, 38 පරි. 1-3 ගාථා)

පොළොන්නරු රාජධානි සමයේ 1 වන විජයබාහු රජුගේ සහෝදරිය වූ මිත්තා කුමරිය 1 වන විජයබාහු රජුගේ මරණින් පසු දේශපාලන කටයුතුවලට ප්‍රබල ලෙස මැදිහත් වූ බව හඳුනාගත හැකිය. 1 වන විජයබාහු රජු මියගිය පසුව මිත්තා කුමරිය මැදිහත් වී රුහුණේ ආදිපාද තනතුර දැරූ වික්‍රමබාහු කුමරුට නොදන්වා යුවරාජ තනතුරේ සිටි ජයබාහු කුමාරයාව රාජ්‍යත්වයට පත් කළ අතර මිත්තාවගේ වැඩිමහල් පුත්‍ර මානාභරණව යුවරාජ තනතුරට පත් කරන ලදී. (මහාවංසය, 61 පරි. 1-8 ගාථා) කාන්තාවන් රජුන්ගේ තීරණවලට බලපෑම් කිරීම් පිළිබඳව ද තොරතුරු හමු වේ. කෝට්ටේ රාජධානි සමයේ 6 වන විජයබාහු රජු සිය දෙවන බිසවගේ බලපෑම මත රාජ්‍ය උරුමය එම බිසවගේ පුත්‍රයාට ලබා දීමට උත්සාහ කිරීම පිළිබඳ කදිම නිදසුනක් විජයබා කොල්ලය පුවත ඇසුරින් හෙළිදරව් වේ. රජුන්ගේ අන්තඃපුර ස්ත්‍රීන් දේශපාලනයට සම්බන්ධ වීම පිළිබඳ තොරතුරු ද ඉදිරිපත් වේ. අනුරාධපුර රාජධානි සමයේ 1 වන උපතිස්ස රජුගේ අන්තඃපුර ස්ත්‍රියක් විසින් රජුව මරා දැමීමට කටයුතු කළ බවට මහාවංසයෙන් තොරතුරු ඉදිරිපත් වේ. "රජහු කිදොවුන් මල් මහානාම නම් කුමරු නිසා අභ්‍යන්තර වූ දේවියක් තොමෝ ආයුධයකින් පැහැර නො කරුණෙහි රජු මැරුවා කිස් දොවුන් මල් හේ තෙමේ බැයා සජීව කල පැවිදිව හිඳ රජු මැරූ කල්හි හීන භාවයට හෝ ගිහි බවට හැරී රජ විය. භාතෘ ඝාතක මෙහෙසිය තමා අග මෙහෙසුන් කෙළේ ය." (මහාවංසය, 37 පරි. 208 ගාථාව)

**තනතුරු හා නම්බුනාම**

පුරුෂයන් මෙන් කාන්තාවන් ද විවිධ තනතුරු දරන ආකාරයක් දිස් වේ. 1 වන සේන රජු තම දියණියන් අතරින් සංඝා කුමරිය "රජිනි" තනතුරේ පිහිටුවීම පිළිබඳ තොරතුරු මහාවංසයෙන් ඉදිරිපත් වේ. "රජ තෙම ඒ කුමරියන් මනා කොට වඩා දිවසරන් බඳු මනා රූ ඇති පින් ඇති යොවුන් පත් රජ කුමරියන් තුන් දෙනා අතුරෙන් සංඝා නම් වූ කුමරිය රජිනි තන්හි තබා රජය සම වූ මහා භෝග දී උපරජහට දෙවි." (මහාවංසය, 50 පරි. 57-58 ගාථා) තවද 4 වන මිහිඳු රජු කාලිංග දේශයෙන් ගෙන්වාගත් බිසවට දාව උපන් දියණියට "යුවරාජිනී" තනතුර ද ලබා දීම පිළිබඳ මහාවංසයේ සඳහන් වේ. "...ඒ රජනට පුතුන් දෙදෙනෙක් හා මනෝරංජනය කරන එක් දුවක් ද වූහ. පුතුන් ඈපා කළහ. දියණියනුත් යුවරාජිනිය

කෙළේය." (මහාවංසය, 54 පරි. 10 ගාථාව) පළමුවන පරාක්‍රමබාහු රජුගේ පොත්ගුල් විහාර ලිපියේ අග බිසව "මහෙසි" ලෙස හැඳින්වූ අතර දෙවන බිසව වූ චන්ද්‍රාවතී "රාජිනී" පදවිය ලැබූ බව පෙනේ. " පරක්කම නරින්දස්ස මහෙසී ත ස්ස ධිම තො රජ්ජෙ ධීතා සා කා රෙසි විහා රං සකල මපුන තස්සෙ ච නරදෙව ස්ස දුතී යං යා අග්ග තං ගතා සා රා ජී නි චන්ද වතී තාය කා රිතමඬපො" (Epigraphia Zeylanica Vol.II, 1928)

දේශපාලන ක්ෂේත්‍රයට සම්බන්ධ වූ කාන්තාවන් විරුද නාමයන් දැරීම පිළිබඳව ද තොරතුරු ඉදිරිපත් වේ. පොළොන්නරු රාජධානි සමයේ රජ කළ කල්‍යාණවතී රැජිණ "අභාසලමෙවන්" විරුදය භාවිතා කිරීම පිළිබඳ බතලගොඩ වැව ලිපිය හා බෝපිටිය සෙල්ලිපිය ඇසුරින් නිදසුන් හමු වේ. "...[ත්‍රි] සිංහලයෙහි එක්සැත්රජසිරි පැ(මි‍ණි)...[අභාසලමෙ]වන් කල්‍යාණවතී..." යනුවෙන් බතලගොඩ වැව ලිපියෙහි සඳහන් වන අතර (Epigraphia Zeylanica Vol. IV, 1941) "ශ්‍රී අභා සලමෙවන් කල්‍යාණවතී ස්වාමින් වහන්සේ..." ලෙසට බෝපිටිය සෙල්ලිපියෙහි සඳහන් වේ. (Epigraphia Zeylanica Vol.II, 1928)

දේශපාලන කටයුතුවලදී කාන්තාවන්ට පැවති ගරුත්වය පිළිබඳ ව රජුගේ මව් බිසවගේ උපදෙස්වලට ප්‍රධාන තැනක් හිමිවීම හා ප්‍රධාන බිසෝවරුන්ට රාජ සභාවේ වැදගත් ස්ථානයක් හිමිවීම විමසන විට හඳුනාගත හැකි වේ. පොළොන්නරු රාජධානි සමයේ නිශ්ශංකමල්ල රජු දවස රාජ සභාවේ වැදගත් ස්ථානයක් ප්‍රධාන බිසෝවරුන්ට හිමි වූ බව දොරටියාව සන්නස, අල්ලෙයි සන්නස අනුව පැහැදිලි වන බව පෙනේ. (මුණසිංහ, 1998) රජුගේ ප්‍රධාන බිසෝවරුන් වූ සුභද්‍රා මහා දේවිය සහ කල්‍යාණවතී දේවිය යන දෙදෙනා ද යුවරජ, සේනාපති, අධිකරණ නායක සහ සභාපති නායක සමඟ රාජ සභාව හොබවන ලද බවට තොරතුරු හමුවේ. අල්ලෙයි තඹ සන්නසෙහි සඳහන් වන ආකාරයට,

> "...සක්විති නිශ්ශංකමල්ල නිෂ්කළංක
> කාලිංග පරාක්‍රමබාහු චක්‍රවර්තී සුවාමි
> න් වහන්සේ තුන්දා ගෙදොරැ අභිශෙක ම
> ඬපයට වැඩැ සහ වොටුනු රජබරණි
> න් සැදි අගබිසො සුභද්‍රා මහාදෙවීන් වහන්
> සේ හා කල්‍යාණ මහා දෙවීන් වහන්සේ හා යුව
> රජවැ සිටි උරෙයි දා වීරබාහු මහාපාණන්ව
> හන්සේ හා ලක් විජයසිඟු සෙනෙවි තාවුරුනාව
> න් හා ලංකා අධිකාර ලොලු පැලැකුළු කිතල්නාව
> න් හා ලංකා අදිකාර තොටදනවු සුවතාවන් හා
> අදි
> කාර තොටදනවු සාතානාවන් හා සභාපතිනායක
> දහම්බඩහැලි ගජබාහුනාවන් ඇතුළු වූ ඇ
> මැති ගණ පිරිවරා රාජධුර විචාරා..."

යන පාඨයෙන් (රණවැල්ල, 1998) ඒ බව ඉස්මතු වේ. තවද සන්නස්වල දැක්වෙන ව්‍යවස්ථාවලට සාක්ෂිකරුවන් වශයෙන් ද බිසෝවරු අත්සන් තැබූ බව දක්නට ලැබේ. දොරටියාව සන්නසෙහි නිශ්ශංකමල්ල රජු සුභද්‍රා මහා දේවිය සහ කල්‍යාණ මහා දේවිය ඇතුළු වූ ඇමති ගණා පිරිවරා ගෙන රාජධුර විචාරා ව්‍යවස්ථා වදාළ බව සඳහන් වේ. (මුණසිංහ, 1998)

තම වංශය පිළිබඳ මහත් වූ අභිමානයෙන් යුතුව සිටි කාන්තාවන් පිළිබඳව ද සාහිත්‍යමය මෙන්ම පුරාවිද්‍යාත්මක යන දෙඅංශයෙන්ම නිදර්ශන හමු වේ. පොළොන්නරු රාජධානි සමයේ 1 වන පරාක්‍රමබාහු රජුගේ මෑණියන් වූ රත්නාවලී බිසව තම කාලිංග ප්‍රභවය පිළිබඳ අභිමානයෙන් සිටි බවට කදිම නිදසුනක් මහාවංසයෙන් හමු වේ. "සූර්‍ය වංශයට ආභරණයක් බඳු වූ දේවි තොමෝත් ඒ සියල්ල අසා සප්‍රකාරයෙන් ඒ නුරුස්ති රජහට මෙපවත් කීවා ය. " විජය කුමර තෙම සියලු යකුන් මරා මේ ලක්දිව යම් කලෙක මනුෂ්‍ය වාස කළේ නම් එතැන් පටන් අප හා විජය රජ කුලය ගැළපූහ. කලිඟුවස උපනුත් සමගම (ආවාහ විවාහ) සම්බන්ධය කළ පුරුදු ඇත්තේ අන් රජුන් හා අපගේ සම්බන්ධයක් ඇසූ විරූදත් නැත. සෝමවංශයෙහි උපන් රජුන් සිටිය දී තොපගෙන් ජාත යයි අප හා ඒ සම්බන්ධය තෙමේ ආර්යත්වයෙහි උපන් මේ කුමර හා කෙසේ වන්නේ දැ" යි (කීවාය)". (මහාවංසය, 63 පරි. 13-17 ගාථා) 1 වන වික්‍රමබාහු රජුගේ බිරිඳ වූ කාලිංග වංශික සුන්දර මහා දේවිය තම කාලිංග ප්‍රභවය පිළිබඳ මහත් අභිමානයෙන් සිටි බව දිඹුලාගල මාරාවිදිය ලිපියේ අන්තර්ගත තොරතුරු අනුව ගම්‍ය වේ. "ඔකාවස්රජකුලෙන් නිපන් සුදොනාපරපුරෙන් ආ හිරුගොත්කුලෙන් (අභින්නවූ රූසිරින් සිරි) දිනූ ලදවොටුනු මැ....න් වික්මබා නිරින්දුහට අගමෙහෙසුන්වූ ගජබාහු දෙවයන් (වැදූ) සුන්දරමහදෙවියන්වහන්සේ..." (Epigraphia Zeylanica Vol.II, 1928) යනුවෙන් එහි සඳහන් වේ.

රජුණ්ට අභියෝග කිරීමට කටයුතු කළ කාන්තාවන් පිළිබඳව ද සාධක හමු වේ. පොළොන්නරු රාජධානියේ 2 වන ගජබාහු රජු මියගිය විට ගිවිසුම්ප්‍රකාරව 1 පරාක්‍රමබාහුට රාජ්‍යත්වය හිමිවිය යුතු වුවද ගජබාහු රජුගේ ඇමතියන් එක්ව සුගලා

බිසවගේ පුත්‍රයා වූ මානාභරණ බලයට පත් කළ අතර පසුව පරාක්‍රමබාහු විසින් මානාභරණව පරාජය කළ නිසාවෙන් සුගලා දේවිය දන්ත ධාතුව රැගෙන රුහුණු ප්‍රදේශයට පළා යාම හා එහි සිට 1 පරාක්‍රමබාහු රජුට විශාල අභියෝගයක් එල්ල කිරීමට සමත් වූ බව පෙනේ. (මහාවංසය, 72 පරි. 74 පරි. 39-182 ගාථා)

**රාජ්‍යත්වය සහ කාන්තාව**

පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන කටයුතු කෙරෙහි කාන්තා සහභාගීත්වයේ උච්චතම අවස්ථාව ලෙස රාජ්‍යත්වයට කාන්තාවන් පත් වීම හඳුනාගත හැකිය. පරිපාලන තන්ත්‍රයේ ඉහළම සංස්ථාව ලෙස ද රාජ්‍ය මෙහෙයවීමේදී තීරණ ගන්නා තනතුර ලෙස ද හඳුනාගත හැකි රාජ්‍යත්වය වනාහි අසීමිත විධායක හා අධිකරණ බලයක් සහිත අවස්ථාවක් වන අතර රාජ්‍යත්වයට පත් වීම පහසු කටයුත්තක් නොවුණු බව ඉතිහාසය විමසීමේදී පැහැදිලි වේ. අනුරාධපුර රාජධානි සමය විමසන විට අනුලා රැජිණ ක්‍රි. පූ. 48-44 දී ත් (මහාවංසය, 34 පරි. 15-27 ගාථා) සීවලී රැජිණ ක්‍රි. ව. 35 දී මාස හතරක පමණ කාලයක් රාජ්‍යත්වය හොබවා ඇති අතර (මහාවංසය, 35 පරි. 14 ගාථාව) පොළොන්නරු රාජධානි සමය විමසන විට ලීලාවතී රැජිණ පළමුවර ක්‍රි. ව. 1197-1200 අතර කාලයේදීත් දෙවන වර ක්‍රි. ව. 1209-1210 අතර කාලයේදීත් තෙවන වර ක්‍රි. ව. 1211-1212 අතර කාලයේදීත් (මහාවංසය, 80 පරි. 31, 44, 48-49 ගාථා) කළ්‍යාණවතී රැජිණ ක්‍රි. ව. 1202-1208 අතර කාලයේදීත් (මහාවංසය, 80 පරි. 33-38 ගාථා) පාලන කටයුතු මෙහෙයවා තිබේ. මෙහිදී දැකගත හැකි තත්ත්වය නම් බොහෝ විට රජුන්ගේ බිසෝවරුන් රජුගේ මරණින් පසුව මෙලෙස රාජ්‍යත්වයට පත්ව ඇති බවයි. නමුත් සීවලී රැජිනට නීත්‍යානුකූලව රාජ උරුමය හිමි වූ බව පෙනේ. "චූලාභය රජු ඇවෑමෙන් ඒ රජු නැගෙණි වූ ආමණ්ඩ රජ දූ වූ සීවලී කුමරිය සාර මසක් රජ කරවී." (මහාවංසය, 35 පරි. 14 ගාථාව) ලෙස මහාවංසයේ සඳහන් වේ. "බිසෝවරුන්ට රජකමට හැකි හෙයින්" යනුවෙන් සද්ධර්මරත්නාවලියේ දැක්වෙන පාඨය (සද්ධර්මරත්නාවලිය, 362 පි.) අනුව රාජ්‍යත්වයට පත් වීමට කාන්තාවන්ට හැකි වූ බව පෙනේ. මහාවංසයට අනුව කළ්‍යාණවතී රැජිණට වසර 6 ක් වැනි කාල පරිච්ඡේදයක් රාජ්‍ය පාලනය කිරීමට හැකි වූ බව පෙනෙන අතර (මහාවංසය, 80 පරි. 33 ගාථාව) මිනිපේ පුවරු ලිපියේ කළ්‍යාණවතී රැජිණගේ 8 වන රාජ්‍ය වර්ෂයේදී සිදු වූ ද්‍රවිඩ ආක්‍රමණය පිළිබඳ සඳහන් වීමෙන් (Epigraphia Zeylanica Vol.V, Part I, 1966) වසර 8 කට ආසන්න කාලයක් පාලනය කිරීමට හැකි වූ බව පෙනේ. මෙයින් කාලිංග - පාණ්ඩ්‍ය පෙළපත් අතර රාජ්‍යත්වය සඳහා අරගල හා අස්ථාවර දේශපාලන තත්ත්වයක් පැවති වකවානුවක සැළකිය යුතු කාල පරිච්ඡේදයක් පාලන කටයුතු මෙහෙය වීමට හැකි වීම ඉතා වැදගත් අවස්ථාවකි. තවද මහාචාර්ය ඇස්. බී. හෙට්ටිආරච්චි මහතා වැනි උගතුන් කාන්තාව දේශපාලනයට සම්බන්ධ වීමෙන් අර්බුධ උද්ගත වීම පමණක් සිදු වූ බව දැක්වුවද මහාචාර්ය ඉන්ද්‍රණී මුණසිංහ මහත්මිය පෙන්වා දෙන්නේ කාන්තාවන් රාජ්‍යත්වයට පත් වීම දේශපාලනික වශයෙන් ලැබූ ජයග්‍රහණයක් වන අතර සසදාවත වැනි මූලාශ්‍ර අනුව ලීලාවතී වැනි රැජිණියන්ගේ පාලන සමයන් සමෘද්ධිමත් වූ බව හඳුනාගත හැකි බවයි. (මුණසිංහ, 1998)

තවත් විටෙක තමන්ට අවශ්‍ය පුද්ගලයන් රජ කරවා තමන් බලය මෙහෙයවමින් රජුටත් ඉහළින් ක්‍රියාකිරීමට කටයුතු කළ කාන්තාවන් පිළිබඳ තොරතුරු හමු වේ. අනුරාධපුර රාජධානි සමයේ අනුලා දේවිය විසින් ඇයගේ ස්වාමියා වූ චෝරනාග රජුව මරා පසුව අවස්ථාව අනුව සිව, වටුක, දාරුභාතික තිස්ස, නිලිය ආදීන් රජ කරවා තමන්ට අවශ්‍ය පරිදි බලය මෙහෙයවීම පිළිබඳ මහාවංසයේ මෙන්ම වංසත්ථප්පකාසිනියේ තොරතුරු අන්තර්ගත වේ. (මහාවංසය, 34 පරි. 16-27 ගාථා, වංසත්ථප්පකාසිනී, 502-504 පි) තවද 2 වන මුගලන් රජුගේ බිසව තම ඥාතීන්ට වස දී මරවා තම පුත්‍ර කිත්සිරිමේඝ රාජ්‍යයට පත් කර ඇය පාලන කටයුතු මෙහෙය වූ බව මහාවංසයේ සඳහන් වේ. "ඒ සුළු මුගලන් රජහු මෙහෙසී තොමෝ විස යොදා නෑයන් මරා පිත්හු රාජ්‍යයෙහි අභිෂේක කොට තොමෝ රාජ්‍යය විචාළාය. " (මහාවංසය, 40 පරි. 64 ගාථාව)

දේශපාලන කටයුතු කෙරෙහි කාන්තා සහභාගීත්වය විමසන විට හඳුනාගත හැකි තවත් ලක්ෂණයක් වෙයි. එනම් මුල් කාලීන අවධියේ සිටම දේශපාලන කටයුතු හා සම්බන්ධ වීමේ අවස්ථාව හිමි වූයේ සමාජයේ ඉහළ තත්ත්වයක් හිමිකරගෙන සිටි කාන්තාවන්ට බව ඉහත සෑම අවස්ථාවකදීම පාහේ පිළිබිඹු වේ. එමෙන්ම දේශපාලන ක්ෂේත්‍රයට විවිධ අයුරින් සම්බන්ධ වී සිටි පුද්ගලයන්ගේ මෑණිවරුන් හෝ බිරින්දෑවරුන් හෝ සහෝදරින් හෝ දියණියන් මෙලෙස දේශපාලන කර්තව්‍යයන්හිදී ඉදිරියට පැමිණ ඇති බව පැහැදිලිව හඳුනාගත හැකි වේ. හමුවන සාධක අනුව විමසන විට ප්‍රභූ තත්ත්වයෙන් බාහිර කාන්තාවන් මෙලෙස දේශපාලන කටයුතු සඳහා සහභාගී වී ඇති ආකාරයක් හඳුනාගත නොහැකිය. මේ නිසා පැහැදිලි වන්නේ දේශපාලන කටයුතු

කෙරෙහි කාන්තා සහභාගීත්වය සඳහා දේපල හිමිකම හා සමාජමය තත්ත්වය ඉතා වැදගත් අවස්ථාවක් වී ඇති බවයි.

වංසකතාගත තොරතුරු අනුව කාන්තාවන් දේශපාලනයට සම්බන්ධ වීම නිසා අවුල් සහගත තත්ත්වයන් ඇති වූ අවස්ථාවන් ද පවතින බව පෙනේ. මහාවංසයට අනුව රාජ්‍යත්වයට උරුමකම් පැවති අයට වස දී මරා දැමූ මෙහෙසිය කිත්තග්ගබෝධි නාමික වශයෙන් තබාගෙන රාජ්‍ය විචාරන ලද අතර මේ නිසා රාජ්‍යයේ සියලු කටයුතු කණපිට පෙරළුණු බව ද රාජකීය නිලධාරීන් කල්පනා කළේ අල්ලස් ගැනීම පිළිබඳ පමණක් වන අතර බලවතුන් පීඩිතයන් පෙළූ බව සඳහන් කර තිබේ. (මහාවංසය, 41 පරි. 67-68 ගාථා) නමුත් මෙවැනි තත්ත්වයන් උද්ගත වූයේ කාන්තාවන් දේශපාලන කටයුතුවලදී මූලික වීම නිසා පමණක් නොවන බව කරුණු විමසන විටට පැහැදිලි වේ. අනුරාධපුර රාජධානි සමයේ අවසාන භාගයේ සිටි 5 වන මහින්ද රජු දවස රාජකීය හමුදා භටයන් වැටුප් ඉල්ලා රජ මාළිගය වට කළ අතර දුරබැහැර ප්‍රදේශවල වාසය කළ සාමාන්‍ය ජනතාව පවා බදු ගෙවීම පැහැර හරින ලද බව මහාවංසයේම සඳහන් වේ. (මහාවංසය, 51 පරි. 3-6 ගාථා) මහාචාර්ය ඇස්. බී. හෙට්ටිආරච්චි මහතා වැනි උගතුන් කාන්තාව දේශපාලනයට සම්බන්ධ වීමෙන් උද්ගත වූ අර්බුධ සහගත තත්ත්වයන් හා අයහපත් බලපෑම් පිළිබඳ සාකච්ඡා කරමින් කාන්තාවගේ දේශපාලන කාර්ය සංසිද්ධිය ඉතා පහළ මට්ටමක පවතින්නක් බව පෙන්වා දී ඇති බව ද දක්නට ලැබේ. (හෙට්ටිආරච්චි, 2008) නමුත් එකී අවස්ථා විමසන විට පැහැදිලි වන්නේ මෙම අර්බුධකාරී තත්ත්වයන් ඇති වූයේ කාන්තාවන් දේශපාලනයට සම්බන්ධ වීම නිසාම නොව ඒ සඳහා බලපෑ තවත් සමකාලීන හේතූන් ගණනාවක් පැවතීම නිසා බවයි. අනුලා රැජිණගේ කටයුතු දක්වන මහාවංසය ඇය විසම ක්‍රියා ඇත්තියක ලෙස සඳහන් කරනු ලැබුවත් ඇයගේ පාලනය අතරතුරු ජනතා නැගී සිටීමක් ඇති වූ බවක් නොපෙනේ. (මහාවංසය, 34 පරි. 15-27 ගාථා)

**සමාලෝචනය**

මේ ආකාරයට පුරාතන ශ්‍රී ලාංකේය සමාජය විමසන විට කාන්තාවන් ඍජුව මෙන්ම වක්‍රාකාරව දේශපාලන කටයුතු සඳහා සම්බන්ධ වූ බව පැහැදිලි වේ. විශේෂයෙන්ම රාජ්‍යත්වය හා රාජ්‍ය වර්ධනය වීම ආරම්භ වන අවධියේ සිටම පුරුෂයන් මෙන් කාන්තාවන් ද විවිධ බලතල දැරීම, රාජ්‍යත්වය හා රාජ්‍ය වර්ධනය වීමෙන් පසු බොහෝ දේශපාලන කටයුතුවලට සම්බන්ධ වීම, විවිධ අංශයන්හි දේශපාලන කටයුතුවලට කාන්තාව අත්‍යවශ්‍ය කෙනෙකු වීම, දේශපාලනයේ වැදගත් තනතුරු කාන්තාවන් ද දැරීම, විවිධ විරුදයන් භාවිතා කිරීම, දේශපාලනයේ උච්චතම අවස්ථාව වන රාජ්‍යත්වයට පවා කාන්තාව පත්වීම, රජුණ්ට උපදෙස් දීම, රජුණ් මෙහෙයවීම මගින් රජුණ්ටත් ඉහළින් සිටීම, ඇතැම් විට පුරුෂයන් අභිබවා තමාට අවශ්‍ය ලෙස කාන්තාවන් ක්‍රියාත්මක වීම වැනි අවස්ථාවන් රාශියක් හඳුනාගත හැකි වේ. එමෙන්ම දේශපාලන කටයුතු හා සම්බන්ධ වූ කාන්තාවන් පිළිබඳ විමසන විට ඔවුන් සමාජයේ ඉහළ තත්ත්වයක් දැරුවන් වූ බවත් ඔවුන්ට දේශපාලනය හා සමීප සබඳතාවයක් පැවති බවත් පැහැදිලි වේ. අතීතයේ සිට දේශපාලන කටයුතු කෙරෙහි පුරුෂාධිපත්‍යයක් දෘෂ්‍යමාන වුව ද කාන්තාවන් ද පුරුෂයන්ට දෙවෙනි නොවන ආකාරයෙන් අනෙක් අංශයන්හිදී මෙන් දේශපාලන කටයුතුවලදී ද ක්‍රියාශීලී තැනැත්තියක වූ බව පැහැදිලි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ආරියපාල, ඇම්. බී. (1962). මධ්‍ය කාලීන ලංකා සමාජය. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඉන්ද්‍රපාල, අයි. කේ. (1965). "සමාජ තොරතුරු", අනුරාධපුර යුගය. සංස්. අමරදාස ලියනගමගේ සහ රණවීර ගුණවර්ධන. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඌනපූරණසහිතො මහාවංසො. (1959). සංස්. ඒ. පී. බුද්ධදත්ත හිමි. කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

එල්ලාවල, හේම. (1962). පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය. කොළඹ : සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

දීපවංශය. (1990). සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි. කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

පරණවිතාන, ඇස්. (1972). "පොළොන්නරු යුගයේ සභ්‍යත්වය : දේශපාලන, ආර්ථික හා සමාජ තත්ව", ලංකා විශ්වවිද්‍යාලීය ලංකා ඉතිහාසය, I කාණ්ඩය, II භාගය. සංස්. හේමචන්ද්‍ර රාය, කැළණිය : විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

මහාවංසය. (2018). සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ පඬිතුමන්, දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මුණසිංහ, ඉන්ද්‍රාණි. (1998). පැරණි ලක්දිව කාන්තාව (ක්‍රි. පූ. සවන සියවසේ සිට ක්‍රි. ව. පහළොස්වන සියවස දක්වා). දෙහිවල : කතෘ ප්‍රකාශනයකි.

රණවැල්ල, සිරිමල්. (1998). "කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජුගේ අල්ලෙයි තඹ සන්නස", සුබස, 14 වෙළුම.

රාජාවලිය. (1926). සංස්. බී. ගුණසේකර මුදලිමන්ත්‍රී, කොළඹ : රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

ලියනගමගේ, අමරදාස. (1989). මධ්‍යකාලීන ලංකා ඉතිහාසය පොළොන්නරු රාජධානියේ පරිහානිය සහ දඹදෙණි රාජධානියේ නැගීම (ක්‍රි ව 1180 සිට 1270 දක්වා). කොළඹ : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ලියනගේ, කමලා සහ සුමුදු වළාකුළගේ. (2006). ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රීවාදය. කොළඹ : ෆෙඩ්රික් ඊබට් පදනම.

වංසත්ථප්පකාසිනී මහාවංසටීකාව - සිංහල අනුවාදය. (1994). අනු. අකුරටියේ අමරවංස නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක, කැළණිය විශ්වවිද්‍යාලය : පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

විමලචන්ද්‍ර, වෝල්ටර්. (1984). "උඩරට රාජධානිය", මහවැලි වංශය, පළමු කාණ්ඩය. සංස්. ටී. බී. එම්. අභයසිංහ සහ තවත් අය, කොළඹ : රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

සද්ධර්මරත්නාවලිය. (1985). සංස්. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපාකාර සමාගම, කොළඹ : ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති. (2001). රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි. කොළඹ : දයාවංශ ජයකොඩි සහ සමාගම.

සෝමතිලක, මහින්ද. (2019). උඩරට නායක්කර් පාලන සමය සහ සමකාලීන බෞද්ධ සංස්කෘතිය. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හෙට්ටිආරච්චි, ඇස්. බී. (2008). ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය ක්‍රි. ව. 300 පමණ සිට ක්‍රි. ව. 1000 පමණ දක්වා. මහරගම : කතෘ ප්‍රකාශනයකි.

ගයිගර්, විල්හෙල්ම්. (1969). මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය. පරි. ඇම්. බී. ආරියපාල, කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

Inscription of Ceylon, Vol. I. (1970). ed. S. paranavithana, Colombo : Department of Archealogy.

Epigraphia Zeylanica Vol. II. (1928). ed. D. M. de. Z. Wickremasinghe, New Delhi : Asian Educational Services.

Epigraphia Zeylanica Vol. IV. (1941). ed. S. paranavithana, New Delhi : Asian Educational Services.

Epigraphia Zeylanica Vol. V, Part I. (1966). ed. S. Paranavitana and C. E. Godakumbura, New Delhi : Asian Educational Services.

Paranawitana, S. (1936). "Two Royal Titles of the Early Sinhalese and the Origin of Kingship in Ancient Ceylon", Journal of the Royal Asiatic society (Great britain and Ireland).